**ශීර්ෂය 127 - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,090,495,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,952,287,990 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.26,368,672 ක් හා රු.111,838,338 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 11 ක් හා සියයට 06 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 127 | 229,590,000 | 203,221,328 | 26,368,672 | 11 |
| 221 | 1,860,905,000 | 1,749,066,662 | 111,838,338 | 06 |
| එකතුව | 2,090,495,000 | 1,952,287,990 | 138,207,010 | 07 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12701 | 6,500,000 | 5,733,267 | 2,000,000 | 5,858,481 | 21,000,000 | 14,246,263 |
| 22101 | 98,000,000 | 54,009,983 | 45,000,000 | 54,244,759 | 248,000,000 | 234,594,466 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.606,911,372ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 7002/0000/00/0249/0013 | 21,203 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 7002/0000/00/0060/0013 | 606,890,169 |
| එකතුව | | 606,911,372 |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.2,289,725,189ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0040/000 | 4,696,701 |
| | 6000/0000/00/0015/0175/000 | 15,579,325 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0102/000 | 2,268,750,640 |
| | 6000/0000/00/0003/0035/000 | 387,228 |
| | 6000/0000/00/0006/0029/000 | 311,295 |
| එකතුව | | 2,289,725,189 |

## 2 කොටස

-----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

---

**1. ශීර්ෂය 127 - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය**

### 1.1 විගණන විෂය පථය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-----------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.210,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 49 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ත් සියයට 87 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 12701 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.145,897ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) අයවිය යුතු හිඟ ණය පිළිබඳ කාළ විශ්ලේෂණයක් සැසඳුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ණයදීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධානයන් ප්‍රකාරව පවත්වාගත යුතු ණය සහ අත්තිකාරම් පිළිබඳ ණයගැති හා ණයහිමි ලේඛන නඩත්තු කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ ලැයිස්තුවේ ගිණුම් ශේෂය රු.479,260ක් වැඩියෙන් දක්වා තිබුණි.

(v) අයවිය යුතු රු.259,309ක ණය ශේෂයන් කේවල ශේෂ ලැයිස්තුවේ ඇතුළත් නොවීම නිසා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙන් අත්හැරී තිබුණි.

(vi) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාර ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.268,256ක් නිරවුල් කර නොතිබුණි.

(vii) දැනට සේවයේ නොමැති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ 09කට අදාලව රු.556,069ක හිඟ ණය අත්තිකාරම් සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ලේඛනයෙහි ඇතුළත් කර තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර, වැඩ බැලීමේ පදනමින් කම්කරු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයකු අභ්‍යන්තර විගණක වශයෙන් පත්කර තිබුණි. කෙසේ වුවද අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලය හා රියදුරු කාමරයෙහි භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මැයි 31 දින වන විටත්

විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 757(2) හා 1647(අ) ප්‍රකාරව අමාත්‍යාංශය සතු සියළු වාහන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

(iii) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව සඳහා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂයයන් 2013 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස නොගැනීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ශේෂය රු.690,969 කින්ද, යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ශේෂය රු.917,669 කින්ද වැඩියෙන් දක්වා තිබුණි.

(iv) 2012 වර්ෂයේදී අපහරණය කරන ලද වාහන 06 කට අදාලව වත්කම් අපහරණ වටිනාකම ලෙස අලෙවි වටිනාකම වූ රු.4,052,000ක් වත්කම් වලින් අඩුකර තිබූ අතර පිරිවැය වටිනාකම මත වත්කම් ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන හයක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුව සතුවූ මෝටර් වාහන දෙකක් (කාර් රථයක් සහ වෑන් රථයක්) විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.3,601,719ක් වූ අතර, එම ශේෂ වර්ෂයකට වඩා අඩු ඒවා විය. උක්ත බැරකම්වලට අමතරව වැය විෂයයන් 07ක රු.657,167ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ වාර්තා කර නොතිබුණි.

**1.6 අනුකූල නොවීම්**

---------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

--------------------------------------------------

2013 නොවැම්බර් 23 දින හා ඔක්තෝබර් 14 දිනයන්හිදී දෙවරක් අනතුරට ලක්වූ එක් වාහනයක් සහ 2013 මාර්තු 21 හා දෙසැම්බර් 03 දිනයන්හි අනතුරට පත්වූ වාහන දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තා කැඳවා නොතිබුණි.

**1.7 කාර්යසාධනය**

------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

අමාත්‍යාංශය යටතේ වූ, වන්දි කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) 2013 වර්ෂයේදී වන්දි ඉල්ලීම් 474 ක් ආයතනය වෙත ලැබී තිබූ අතර, ඒවායින් 85ක් අදාල ආකෘතියෙන් ඉල්ලීම් නොකිරීම මත ක්‍රියාත්මක කර නොතිබුණි. එය මුළු වන්දි ඉල්ලීම් සංඛ්‍යාවෙන් සියයට 18ක් විය. කම්කරුවන් විසින් අවිධිමත් ආකාරයට වාර්තා කරන ලද අනතුරු පිළිබඳව කටයුතු කර ඔවුන්ට සාධාරණය ඉටුකර දීම සඳහා සහාය විය යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(ii) වන්දි කොමසාරිස් කාර්යාලය වෙත අනතුරු වාර්තා කිරීම, අදාල ආකෘති අනුව සිදුකළ යුතු වුවත්, ඒ බව පනතින් ආවරණය වන සේවකයන් මෙන්ම සේවා යෝජකයන්ද දැනුවත් කිරීමට අමාත්‍යාංශය විසින් පියවර ගෙන නොතිබුණි.

(iii) ශ්‍රම වාසනා අරමුදල් පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉලක්ක පිහිටුවා ගෙන නොතිබුණු අතර ප්‍රධාන කාර්යයන් ඉටු නොකර තිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| **පනතේ වගන්තිය** | **ඉටු නොකළ කාර්යය** |
|---|---|
| 6(ඉ) | ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ සැපයීම |

| | |
|---|---|
| 13(1) | එක් එක් වර්ෂයේදී මුද්‍රණය කළ යුතු ලොතරැයි සංඛ්‍යාව හා වර්ගය පිළිබඳව ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණීම |
| 13(2) | ලොතරැයියෙන් ප්‍රදානය කරන තෑගී හා හිමිකම් නොවූ තෑගී පිළිබඳව තහවුරු කළ ආකාරය සම්බන්ධයෙන් ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණීම |
| 13(3) | ලොතරැයියෙන් ප්‍රදානය කළ යුතු තෑගීවල වටිනාකම්ද ඇතුළුව ලොතරැයි මණ්ඩලය විසින් දැරිය යුතු වියදම් සම්බන්ධයෙන් අරමුදල හා ලොතරැයි මණ්ඩලය සමඟ එකඟත්වයක් ඇතිකර ගැනීම |
| 10(ඇ) | ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන ආදායම් අරමුදලට ලැබිය යුතු වුවත්, 2008 ඔක්තෝබර් මාසයෙන් පසුව එම ආදායම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබා නොගැනීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු ආදායම රු.229,456,751 ක් වී තිබුණි. මෙම මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් වර්ෂය තුළ ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර අදාළ මුදල් යෙදවීම පිළිබඳ අනාගත සැලැසුම් සකස් කරද නොතිබුණි. |

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

----------------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන් වෙත ළඟාවීමට නොහැකි වූ අවස්ථා 44ක් විය. ක්‍රියාකාරී සැලැස්මෙන් සැලැසුම් කර තිබූ නමුත්, සියයට 100 ක්ම ඉටු නොකළ කාර්යයන් 21ක් විය.

(ii) තවත් කාර්යයන් 23 ක් ඉටු කර නොගැනීම සියයට 09 සිට සියයට 84 දක්වා පරාසයක වූ අතර ඉලක්කයන් වෙත ළඟාවීම දුර්වල මට්ටමක පැවැතුණි.

## 1.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම සඳහා 2013 දෙසැම්බර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 06ට වැඩි වර්ෂ 01ට අඩු උපලබ්ධි නොවූ තැන්පතු රු.1,890 ක් විය.

## 1.9 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වන්දි කොමසාරිස් කාර්යාලය විසින් වන්දි ගෙවීම් සඳහා රු.21,000,000ක් ද පුනරාවර්තන වියදම් සඳහා රු8,451,502ක් ද වශයෙන් එකතුව රු.29,451,502 ක අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණි. එහෙත් භාණ්ඩාගාරය අවස්ථා 05කදී රු.16,300,000 ක් පමණක් ලබා දී තිබුණි.

(ආ) මාරක අනතුරුවලට ලක්වීමෙන් මරණයට පත්වූ කම්කරුවන්ගේ යැපෙන්නන්ට වන්දි මුදල් ගෙවීමේදී හිමිකාරත්වය පිළිබඳ ගැටලු මතුවන අවස්ථාවලදී අදාල වන්දි මුදල, වන්දි ගෙවිය යුතු ආයතන විසින් අදාල වන්දිය වන්දි කොමසාරිස් කාර්යාලය නමින් වූ ජංගම ගිණුමෙහි තැන්පත් කළ යුතුය. එම මුදල්වලින් වන්දි කොමසාරිස් කාර්යාලයේ පුනරාවර්තන වියදම් පියවා ගෙන තිබුණු අතර එම ගිණුමෙහි මුදල් නොමැතිවීම හේතුකොට ගෙන අදාල හිමිකරුවන්ට වන්දි ගෙවීමේ ප්‍රමාදයක් සිදු වී තිබුණි.

## 1.10 පාඩු හා හානි

වර්ෂය තුළ වාහන දෙකකට සිදුවූ සම්පූර්ණ අලාභය රු.146,141ක් වූ අතර රක්ෂණ වන්දි ලෙස රු.62,209 ක් පමණක් ලැබී තිබුණි. මේ අනුව රු.83,932ක රජයට සිදුවූ අලාභය වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.11 අනාර්ථික ගනුදෙනු

ශ්‍රම වාසනා අරමුදලේ නීති ආධාර යෝජනා ක්‍රමය ප්‍රචාරණය කිරිම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරිමට 2013 වර්ෂයේ රු.169,680ක් වැයකර තිබුණි. පුවත්පත් දැන්වීමෙන් පසු රු.10,000 ක් බැගින් වූ නීති ආධාර ලබාදීම සඳහා සේවකයන් පස් දෙනෙකු සුදුසුකම් ලබා

තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් ලබාදීමට යෝජිත ප්‍රතිලාභ ප්‍රමාණයට වඩා සියයට 239 ක් අදාල ප්‍රචාරණ දැන්වීමට වැයකර තිබුණි. නීති ආධාර ලබාදීම, සියලු දීමනා සහිතව රු.15,000 කට නොවැඩි වැටුපක් ලබා ගන්නා සේවකයන් හට පමණක් සිදුකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ නිති ආධාර ඉල්ලුම් කළ සංඛ්‍යාව 16 දෙනෙකු දක්වා පහත වැටී තිබුණි. වර්තමාන වැටුප් තලයන් සැලකිමේදි මෙම වැටුප් සීමාවෙහි වලංගුභාවය විගණනයේදී මතභේදාත්මක විය.

## 1.12 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාල වයස්කරුවන්ව සිට 2013 දෙසැම්බර් 31 දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ වන්දිලාභීන් 353 දෙනෙකුට ගෙවිය යුතු රු.6,609,032 ක වන්දි මුදලක් ප්‍රතිලාභින්ට ගෙවීමට 2014 ජනවාරි 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි. මෙම ගිණුම් ශේෂ 1982 වර්ෂයේ සිට වර්ෂ 30 ක පමණ කාලයක සිට පැවැත එන නොගෙවූ ශේෂ විය.

(ආ) බාල වයස්කාර ගිණුම් හිමියන්ගේ ගිණුම් පොත් 668 ක් සම්බන්ධ ලිපිගොනුවලින් 201 ක් අස්ථානගතවී තිබුණි. ලිපිගොනු, ගිණුම් පොත් හා ලේඛනවල ආරක්ෂාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඇ) 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත 2005 අප්‍රේල් 21 දිනැති අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත මගින් අවසාන වරට සංශෝධනය කර තිබුණි. මෙහිදී කම්කරුවකුගේ මරණය, ස්ථිර දුබලතාවය සහ තාවකාලික දුබලතාවය හේතුවෙන් වන්දි ගෙවන ආකාරය තීරණය කර තිබුණි. ඒ අනුව ගෙවන අවම වන්දි මුදල් ප්‍රමාණයන් තීරණය කර වර්ෂ 09 ක් ගත වී තිබුණත්, වර්තමානයට සරිලන අයුරින් ගෙවනු ලබන වන්දි මුදල් සංශෝධනය කර නොතිබුණි.

(ඇ) ව්‍යවස්ථාපිත අරමුදලක් වන ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු ප්‍රකාරව අරමුදලේ ප්‍රතිලාභ දිවයින පුරා සේවයේ නියුතු සියළු සේවකයින්ට ලැබිය යුතු වුවද, ප්‍රතිලාභවලින් සියයට 75 කට වැඩි ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු සේවකයන්ට පමණක් ලබාදී තිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 10 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 71 | 54 | 17 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 24 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | එකතුව | 120 | 92 | 28 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| (i) | සංවර්ධන නිලධාරි සේවයේ iii වන ශ්‍රේණිය | 06 | වසර 02 |
| (ii) | රියදුරු | 01 | වසර 04 |
| (iii) | රියදුරු | 01 | වසර 02 $^{1}/_{2}$ |

## 2. ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

කම්කරු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 02 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාරිභෝජන ද්‍රව්‍ය ලේඛන පොත. | මුදල් රෙගුලාසි 1647 |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පැමිණිලි ලේඛනය. | වෘත්තීය ස්වස්ථතා අංශය විසින් 2013 වර්ෂයේ ලැබුණු පැමිණිලි 45 ක් ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| වෛද්‍ය වාර්තා ඉල්ලීම් ලේඛනය | වෘත්තීය ස්වස්ථතා අංශය විසින් වර්ෂය තුළ වෛද්‍ය වාර්තා ඉල්ලීම් 90ක් ලේඛනයක සටහන් කර නොතිබුණි. |

**(ආ) විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 නොවැම්බර් 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.4,886,313ක් විය.

**(ඇ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 01 ක් සඳහා සළසා තිබුණු රු.10,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 43 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6ත් සියයට 95 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) සේවක අර්ථසාධක අරමුදලෙහි ප්‍රතිපූර්ණය කරන ලද මුදල් විසර්ජන ගිණුමේ වියදම් ලෙස දක්වා නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ''මෙහෙවර පියස'' ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබූ රු.448,000,000ක අත්තිකාරම් වියදමක් ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

- කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් දරන ලද වියදම ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ප්‍රතිපූර්ණය කර ගනු ලැබුණු රු.865,437,221ක් වියදම් ලෙස සළකා විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. තවද මෙම වියදම් සේවක අර්ථසාධක අරමුදලෙහිද වියදම් වශයෙන් දක්වා තිබුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපාදනය කළ මුදල් ආදායම් ලෙස රු.835,833,541ක් 20.05.99.00 ආදායම් ශීර්ෂයටද, රු.25,811,889ක් 20.03.02.99 ආදායම් ශීර්ෂයට ද බැර කර තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

**------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 අප්‍රේල් 30 දින වන විට දෙපාර්තමේන්තුවට පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.6,715,120ක් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 112 කදී නිලධාරීන් 57ක් වෙත නිකුත් කළ රු.2,021,717ක් කාර්යය නිමවී මාස 01 සිට වර්ෂයකුත් මාස 02ක පරාසයක කාල ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

(iii) නිසිලෙස සැලැසුම් කිරීමකින් තොරව කටයුතු කිරීම නිසා අවස්ථා 16කදී ලබාගත් රු.120,738ක අත්තිකාරම්වලින් සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයකින් වැයකිරීමකින් තොරව ආපසු පියවා තිබුණි.

(iv) දෙපාර්තමේන්තු අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය සමඟ සැසඳීමේදී රු.808,212ක් වූ හර ශේෂයක වෙනසක් නිරීක්ෂණය විය.

එමෙන්ම එම වෙනසට හේතු සඳහන් ප්‍රකාශය අනුව, රු.2,171,444ක හඳුනා නොගත් බැර ශේෂයක් වූ අතර විගණන දිනය වූ 2014 මැයි 12 දින වන විටත් එම ශේෂය හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**(v)** 2013 නොවැම්බර් 18 දිනැති අංක 04/2013 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට වූ මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ටීඕඩී/අයිඑම්පී/06 ආකෘතිය සම්පූර්ණ කර බැංකුවට භාර දී, බැංකුවෙන් ලැබෙන හර නිවේදනයේ සහතික කළ පිටපතක් ටීඕඩී/අයිඑම්පී/06 ආකෘතිය සමඟ 2014 ජනවාරි 02 දින හෝ ඊට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් එම කාර්ය 2014 ජනවාරි 03 දින රු.206,220,118 ක් හා 2014 ජනවාරි 10 දින රු.500,010 ක් වශයෙන් සඳහන් කර හර නිවේදන හා ආකෘති පත් යවා තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.351,492 ක්වූ තැන්පතු 82 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ඔක්තෝබර් 31 දිනැති අංක SA/AS/MS/5/22/10 දරන ලිපියේ සඳහන් උපදෙස් ප්‍රකාරව, සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රකාශන අලෙවියෙන් ලබාගන්නා මුදල්, රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශන අලෙවි ආදායම වූ රු.19,416,481 එම උපදෙස්වලට පටහැනිව අංක 6000-0-0-15-102 දරන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii) අංක 6000/0000/00/0015/0102/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට කාල විශ්ලේෂණය අනුව ශේෂය රු.102,956,261 ක් වූ අතර විසර්ජන ගිණුමේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය ලෙස රු.2,268,750,640 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.2,165,794,379 ක වෙනසක් විය.

(iv) ගිණුම් අංක 6000/0000/000/0003/0035/000 දරන පොදු තැන්පත් ගිණුමේ සඳහන් රු.387,228ක් වූ ශේෂයට අදාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(v) ගිණුම් අංක 6000/0000/000/0003/0035/000 හි 2013 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව ශේෂය රු.50,249,872 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව ශේෂය රු.387,228 ක් වී තිබුණි. ඒ අනුව වෙනස රු.49,862,644 ක් විය.

(vi) අංක 6000/0000/000/0006/0029/000 දරන පොදු තැන්පත් ගිණුමෙහි (ආගමන අරමුදල) රු.311,295ක් වූ ශේෂය සනාථ කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර වර්ෂ ගණනාවක සිට එම ගිණුමෙන් කිසිදු ගනුදෙනුවක් සිදුකර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 22101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.6,080,492ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ii) 2013 වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවේ ආපදා ණය ඉල්ලුම් කළ රජයේ නිලධාරීන් 75 දෙනෙකුට රු.6,890,305ක ආපදා ණය 2014 වර්ෂයේදී ගෙවා තිබුණි. ඒ අනුව ම ණය ඉල්ලුම් කල දිනයේ සිට ණය මුදල ලබා දීමට දින 58 සිට 143 දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි. 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.43,990,017ක් ඉතිරිව තිබූ අතර එය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 45 ක් වී තිබුණි.

(iii) හිඟ ණය පිළිබඳ කාල විශ්ලේෂණය අනුව අවුරුදු 5 කට වඩා පැරණි හිඟ ණය ශේෂය රු.1,277,020ක්ද, වර්ෂ 4 සිට 5 දක්වා පැරණි ශේෂය රු.302,780ක්ද, වර්ෂ 3 සිට වර්ෂ 4 දක්වා පැරණි ශේෂය රු.23,535ක්ද, වී තිබුණි.

(iv) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරියෙකු ස්ථානමාරුවීම් ලබා මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලා ගත වුවද, 2013 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ එකතුව රු.777,476 ක් වි තිබුණත්, 2014 මාර්තු 31 දින වන විටත් ඉන් රු.610,197ක් නිරවුල් කර නොතිබුණි. එයින් රු.113,222 ක් වසර 10 කට වඩා පැරණි ශේෂයක් වි තිබුණි.

(v) ආයතන සංග්‍රහයේ XXXIV පරිච්ඡේදයේ 4.8 වගන්තිය ප්‍රකාරව හිඟ ණය ශේෂ අයවීමට ඇති විට එම ණය ශේෂ පියවා ගැනීමෙන් තොරව නිලධාරින් සංස්ථා සේවයට ස්ථිරව මුදා හැරීම නොකළ යුතු වුවත්, එයට පටහැනිව රු.60,495 හිඟ ණය අයවීමට ඇති නිලධාරින් 11 දෙනෙකු ණය අයකර ගැනිමෙන් තොරව සංස්ථා සේවයට මුදා හැර තිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ ස්ථාපිත අභ්‍යන්තර විගණන ඒකකය මගින් වර්ෂය තුළ පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

- මිලදී ගැනීම්.
- ස්ථාවර වත්කම්.
- එක් එක් අංශ/කාර්යාලයන්හි කාර්යසාධනය.
- ගබඩා පාලනය.
- මානව සම්පත් කළමනාකරණය.
- අභ්‍යන්තර පාලන පද්ධතීන් වැඩිදියුණු කිරීම.

## 2.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන 93 සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයට අදාල වාහන සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබූ ඌණතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1), 104(1) හා 757(7) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) කම්කරු මහ ලේකම් කාර්යාලය යටතේ ඇති මධ්‍යම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි ඇති කුඩා පුස්තකාල 32 හි පොත් පිළිබඳව සමීක්ෂණ සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.12,868,031 ක් විය.

(ii) දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලය විසින් අධිකරණයන්හි සේවායෝජක ආයතනවලට නඩු පවරා, අධිකරණ මඟින් අයකර ප්‍රේෂණය කළ මුදල් හා විවිධ පෙත්සම් පැමිණිලි විභාග කර සමථයකට පත්කර සෘජුවම එම කාර්යාලයට ලැබී තිබුණු එකතුව රු.4,886,313ක් අදාල හිමිකරුවන්ට ලබා නොදී ආයතනයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. එසේ රඳවාගෙන සිටි කාල පරාසය වර්ෂ 01 සිට වර්ෂ 14ක් දක්වා විය.

## 2.6 අනුකූල නොවීම්

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 751 හා 753(1) | 2012 හා 2013 වර්ෂවල මිලදී ගෙන දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයට භාරදී තිබුණු එකතුව රු.4,674,100 වටිනා ලිපිද්‍රව්‍ය, මුද්‍රණාලයේ කිසිදු තොග ලේඛනයක සටහන් කර නොතිබූ අතර මුද්‍රණයට භාවිතා කළ ද්‍රව්‍යද ලේඛනගත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 1647(ආ) | වාහන සහ ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකවද, එක් එක් වාහනයේ ආරක්ෂාව නිලධාරීන් අතර වෙනස්වන විටද, වාහනයේ රියදුරන් වෙනස්වන විටද සමික්ෂණ පැවැත්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645(ආ) හා 1646 | ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු සංචිත වාහන 48 ක දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 40 ක මාස 6 කට වරක් ඉන්ධන දහනය පිළිබඳව චක්‍රලේඛ උපදෙස් අනුව පරීක්ෂා කර නොතිබුණි.<br>පත්කළ සමීක්ෂණ මණ්ඩලය විසින් සමීක්ෂණය කරන ලද වාහන 13 ක් සඳහා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව එක් එක් වාහනය සඳහා විවිධ නිර්නායක භාවිතා කරමින් ඉන්ධන ලීටරයකින් ධාවනය වූ කිලෝ මීටර් ගණන වෙනස් කර නිර්දේශ කර තිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

-----------------------

| | |
|---|---|
| 2009 ඔක්තෝබර් 13 දිනැති අංක 438 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | වෘත්තීය ස්වස්ථතා අංශයේ වර්ග 19ක අයිතම 206 ක කාර්යාල උපකරණද, වර්ග 153 ක අයිතම 186 ක රසායනික ද්‍රව්‍ය හා වෙනත් උපකරණද, වර්ෂ 05 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් තුළ භාවිතයෙන් ඉවත් කල අබිලි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**(ඇ) කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ**

-------------------------------------

| | | |
|---|---|---|
| (i) | 2009 මාර්තු 05 දිනැති අංක 2009/3 දරන චක්‍රලේඛය | සෑම කම්කරු නිලධාරියකුම තමන් වෙත පවරා දී ඇති බලප්‍රදේශ තුළ, සේවකයන් සේවයේ යොදවා ඇති ආයතන පිළිබඳ ලේඛන නඩත්තු කිරීම සඳහා කම්කරු නිලධාරින්ට, සහකාර කම්කරු කොමසාරිස්වරුන්ට සහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්ට උපදෙස් ලබාදී තිබුණද, දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අනුයුක්ත අදාල නිලධාරින් විසින් එම ලේඛන පවත්වා නොතිබුණි. |
| (ii) | 2007 ඔක්තොබර් 31 දිනැති 15/2007 චක්‍රලේඛයේ 4.1 ඡේදය | දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරින් විසින් පරීක්ෂණ වාර්තාවල ප්‍රමාණවත් විස්තර සහ සංඛ්‍යා ලේඛන සහිතව නියමිත ආකෘති පත්‍ර භාවිතා කර නොතිබුණු අතර කෙටි පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි. තවද එම තත්ත්වය ඉහළ නිලධාරින්ගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි. |
| (iii) | 2007 ඔක්තොබර් 31 දිනැති 15/2007 චක්‍රලේඛයේ 5.1 හා 5.2 ඡේද | එක් එක් කම්කරු නිලධාරියා විසින් පවත්වාගෙන යන දින පොත් ඊලග මාසයේ 10 වන දිනට ප්‍රථම සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරින් 08 දෙනා විසින් අවස්ථා 58 කදී දින පොත් දින 05 සිට දින 234 ක පරාසයක කාල පමාවකින් පසුව ඉදිරිපත් කර තිබුණි. |
| (iv) | 2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 චක්‍රලේඛයේ 06 ඡේදය | දකුණු කොළඹ කම්කරු කාර්යාලය විසින් සෑම මාසයක් අවසානයේදීම අසාධාරණ කම්කරු පිළිවෙත් සම්බන්ධ විස්තර කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා) වෙත යවා නොතිබුණි. |

**2.7 කාර්යසාධනය**

------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

----------------------------------------------------

කම්කරු දෙපාර්තමේන්තුවේ සමහර කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව කම්කරු නිලධාරියෙක් මාසයක් තුළ අවම වශයෙන් පරීක්ෂණ 20 ක් සිදුකළ යුතු වුවත්, දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් 07 දෙනෙකු විසින් 2013 ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා කාලසීමාව තුළ කාලීන පරීක්ෂණ 20 කට අඩුවෙන් සිදුකළ අවස්ථා 111ක් අනාවරණය වී තිබුණි. එම දුර්වලතා සම්බන්ධයෙන් සහකාර කම්කරු කොමසාරිස්වරයාගෙන් හේතු විමසා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ii) 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කම්කරු නිලධාරීන් විසින් සෑම පරීක්ෂණයකටම අදාල වාර්තා පරීක්ෂණ දිනයට පසුව එළඹෙන පලමු කාර්යාල දිනයේදී නොපමාව කාර්යාලයට භාරදිය යුතුය. දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් 08 දෙනා විසින් 2013 ජනවාරි හා පෙබරවාරි මාසවලදී කරන ලද පරීක්ෂණවල වාර්තා ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී ආයතන 193 ක පරීක්ෂණ වාර්තා ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි. ප්‍රමාද කාල පරාසය දින 11 සිට දින 189 දක්වා විය.

(iii) 2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ලැබී දින 14ක් ඇතුළත විභාග කිරීමට පියවර ගතයුතු වුවත්, දකුණු කොළඹ කම්කරු කාර්යාලය වෙත 2012 හා 2013 වර්ෂවල ලැබුණු පෙත්සම් හා පැමිණිලි 71ක් 2013 දෙසැම්බර් 03 දින වන විටත් විසඳීමට කටයුතු කර නොතිබුණි.

(iv) කර්මාන්ත ශාලා සහ ඒ ආශ්‍රිත ආයතනවල වැඩ පරිසරවල ඇතිවිය හැකි අන්තරායකාරි තත්ත්වයන් මඟ හරවා සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව

පවත්වා ගැනීම සිදුකළ යුතු වුවද, ලියාපදිංචි කළ ආයතන 25,000 ක් හා ලියාපදිංචි නොවූ ආයතන පැවැතුණත්, 2013 වර්ෂයේ පාරිසරික මිනුම්, ජීව විද්‍යාත්මක පරීක්ෂණ, වෘත්තීය සහ වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා විගණනයන් හා දැනුවත් කිරීම් වැඩසටහන්, සමාලෝචිත වර්ෂයේදී ආයතන 695 ක පමණක් ඉටු කර තිබුණි. ඊට අමතරව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් 153ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(v) දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු (කොළඹ) කාර්යාලය විසින් 1942 වර්ෂයේ සිට වසර 72ක කාල පරාසය තුළදී කර්මාන්තශාලා 4,818 ක් පමණක් වන සුළු සංඛ්‍යාවක් ලියාපදිංචි කර තිබුණි. ලියාපදිංචි වී තිබුණු කර්මාන්ත ශාලාවලින්ද වර්ෂය තුළ කර්මාන්ත ශාලා 1,724 ක් හෙවත් සියයට 35 ක් පමණක් පරීක්ෂා කර  තිබුණි.

(vi) දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු (කොළඹ) කාර්යාලයට සමාලෝචිත වර්ෂයේදී පැමිණිලි 05ක් පමණක් ලැබී තිබුණු අතර, සේවකයන් හා සේවා යෝජකයන් ආයතනය පිළිබඳ නිසි දැනුවත් භාවයක් ලබා නොතිබීම මෙයට හේතුවක් වී තිබුණු අතර, ප්‍රමාණවත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේදී ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(vii) සේවකයන් 600 කට අධික ප්‍රමාණයක් සේවය කරන පුද්ගලික සමාගමකට අදාල පැමිණිල්ලක් සම්බන්ධයෙන් වන පරීක්ෂණ වාර්තාව  විගණන දිනය වන විටත් මාස 05ක් ප්‍රමාද කර තිබුණි. අනෙකුත් පැමිණිලි පරීක්ෂාවන් සම්බන්ධයෙන්ද පසු විපරම් කටයුතු සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක වෙත ළඟාවීමට නොහැකි වූ අවස්ථා 51 ක් නිරීක්ෂණය වූ අතර එම ව්‍යාපෘති සඳහා රු.45,245,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. මෙම ක්‍රියාකාරකම්වලින් සියයට 100 ක්ම ඉටු නොකළ කාර්යයන් 03 ක් පැවති අතර අනෙකුත් කාර්යයන්හි ඉටු නොකළ ප්‍රගතිය සියයට 3 සිට සියයට 93 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වෘත්තීය ස්වස්ථතා අංශය විසින් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ ක්‍රියාකාරකම් පහෙන් පාරිසරික මිනුම් සහ ජීවවිද්‍යාත්මක පරීක්ෂණ යන ක්‍රියාකාරකම් දෙකට අදාල අංගයන් (Event) 397 ක් හෙවත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් සියයට 50 ක් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**2.8** **අනාර්ථික ගනුදෙනු**

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) **HEIDELBERG - GTO 52 -1 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් රු.21,884,084 කට මිලදී ගැනීම**

**-----------------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රු. 21,884,084 ක් වැය කර පුද්ගලික සමාගමකින් HEIDELBERG - GTO 52 -1 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර, තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශයේ සඳහන් වන මුද්‍රණ යන්ත්‍රය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුහුණුව, යන්ත්‍රය සඳහා අවශ්‍ය ඉඩකඩ සහ කම්කරු දෙපාර්තමේන්තුවට මෙවැනි යන්ත්‍රයක් නඩත්තු කිරීමට හැකිද බව යන කරුණු කෙරෙහි අවධානය යොමු නොකර මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ii) යන්ත්‍රය මිලදී ගෙන වසර දෙකකට පසු වර්ෂ 07 තුළ යන්ත්‍රයේ නඩත්තු ගාස්තු ලෙස මිලදී ගත් ආයතනයට රු.1,275,000 ක් ගෙවා තිබුණි.

(iii) මුද්‍රණ යන්ත්‍රය මිලදී ගත් දින සිට මුද්‍රණ ක්ෂේත්‍රයේ දැනුම හා පලපුරුද්ද ඇති සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් 2010 වර්ෂයේදී ආයතනයේ තාක්ෂණික නිලධාරියෙකු වශයෙන් සේවය කළ නිලධාරියෙකුට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ඕෆ්සෙට් හා Lithography මුද්‍රණ කටයුතු පිළිබඳ සහතික පත් පාඨමාලාවකට සහභාගි කරවා තිබුණි. ඉහත පුහුණු නිලධාරියා හා තවත් කිසිදු පුහුණුවක් නොලත් කාර්යාල කාර්ය සහායක සේවයේ සේවකයන් දෙදෙනෙකු විගණන පරීක්ෂණ අවස්ථාව වන විට මුද්‍රණ කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

(iv) තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් පෙන්වා දුන් 30’ x 60’ ප්‍රමාණ වර්ග අඩි 1800 කට නොඅඩු බිම් මහලක් මෙම යන්ත්‍රය සඳහා අවශ්‍ය බව නිර්දේශ කර

තිබුණද, 2009 ජූලි මාසයේදී මෙම යන්ත්‍රය ජාවත්ත කර්මාන්ත සුරක්ෂිතතා කාර්යාලයේ පැරණි වාහන ගරාජයේ ස්ථාන ගත කර තිබුණි.

(v) යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය වායු සමීකරණ කළ පරිශ්‍රයක සිදුකළ යුතු වුවද ඒ සඳහා නිසි සැලැස්මක් නොතිබුණ අතර මුද්‍රණ යන්ත්‍රය හා උපාංග සවිකර ඇති ගොඩනැගිල්ල වාහන ගරාජයකට සුදුසු පරිදි ඉදිකර තිබුණි. මේ නිසා මෙහි බිත්ති හා වහලය මෙන්ම අත්තිවාරමද ටොන් ගණනක් බර යන්ත්‍රාගාරයක් සඳහා නුසුදුසු විය. මෙම යන්ත්‍ර කොටස් වර්ෂා දිනවල වර්ෂා ජලයෙන් තෙමීමෙන් හානී වන බවද අනාවරණය විය. එමෙන්ම මෙම යන්ත්‍රයට විය හැකි ගිනි හානි සම්බන්ධයෙන් නිසි ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vi) 2014 පෙබරවාරි මාසය වන විට රු.9,617,943 ක යන්ත්‍ර කොටස් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූණු අතර, 2014 පෙබරවාරි 13 දින විගණන පරික්ෂාව සිදු කරන විට එම යන්ත්‍ර මල බැදී අක්‍රිය තත්ත්වයේ පැවතුණි. තවද මෙම සියළුම යන්ත්‍ර කොටස්වල වගකීම් කාලය 2008 වර්ෂයේදී නිම වී තිබුණි.

(vii) මිලදී ගැනීමෙන් පසු යන්ත්‍ර කොටස්වලින් මුද්‍රණ යන්ත්‍රය සහ Paper Cutter (Guillotine) යන්ත්‍රය පමණක් භාවිතා කර තිබුණු අතර, ඒවායේ වටිනාකම රු.12,403,397ක් වී තිබුණි. මිලදී ගත් වර්ෂයෙන් පසුව 2010 වර්ෂයේ මුද්‍රණ කටයුතු ආරම්භ කර 2010, 2011, 2012 හා 2013 යන වර්ෂවල පිළිවෙලින් ධාරිතාවයෙන් සියයට 0.7 ක්, සියයට 1.5 ක්, සියයට 14.5 ක් හා සියයට 13 ක් පමණ ප්‍රමාණවලින් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඒ අනුව මෙම වර්ෂ 04 තුළ යන්ත්‍ර ධාරිතාවෙන් සියයට 7.4 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය සැලැකිල්ලට ගත් විට අඩු ධාරිතාවයකින් යුතු මුද්‍රණ යන්ත්‍රයක් ප්‍රමාණවත් වී තිබුණි.

(viii) මෙම යන්ත්‍රයේ ධාරිතාවයට අනුව මුද්‍රණ කටයුතු 90mm x 140mm ප්‍රමාණයේ සිට 500mm x 360mm දක්වා කඩදාසිවල කළ හැකි වුවත්, මෙම ධාරිතාවයන්ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද මෙම මුද්‍රණ යන්ත්‍රය වර්ණ 4 ක මුද්‍රණ යන්ත්‍රයක් වන අතර පසුගිය වර්ෂ 06 තුළම මෙමගින් වර්ණ පිටපත් මුද්‍රණය කර නොතිබුණි.

(ix) රජයේ "ඊ" වැඩපිළිවෙල මත සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවකම තම අන්තර්ජාල වෙබ් පිටු පහසුකම් ජනතාවට ලබා දී ඇති අතර, කම්කරු දෙපාර්තමේන්තුව මෙම "ඊ" වැඩපිළිවෙල හා බද්ධව

ක්‍රියාකර මෙම ආකෘති පත්‍ර මුද්‍රණ පිරිවැය අවම කර ගැනීමට හා මෙයින් ජනතාවට වන පහසුව පිළිබඳවද දෙපාර්තමේන්තුව අවධානය යොමු කර නොතිබුණි.

**(x)** මුද්‍රණ කඩදාසි සහ තීන්ත, රසායන ද්‍රව්‍ය සහ අනෙකුත් මුද්‍රණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් නොතිබුණ අතර රු.34,000ක් වටිනා මුද්‍රණ කඩදාසි වේයන් කා තිබුණි.

## 2.10 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ රු.10,927,729ක් වූ හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා නීති ක්‍රියා 02 නිවේදනය යවා දින 14ක් ඇතුළත අදාල මුදල් නොගෙවූ ආයතන වෙත අවසන් නිවේදන නොයැවූ අවස්ථා 12ක්ද, රු.22,877,423ක් වූ හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා රතු නිවේදන යවා දින 14 ක් ඇතුළත ගෙවීම් නොකළ ආයතන සඳහා අධිකරණ ක්‍රියාමාර්ග නොගත් අවස්ථා 16ක්ද තිබුණි. මෙසේ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම ප්‍රමාද කිරීම නිසා සේවකයන්ට හිමිවිය යුතු ප්‍රතිලාභ අහිමිවීමේ අවදානමක් පැවතුණි.

(ii) දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනවලින් සේවක අර්ථසාධක අරමුදල වෙත අයවිය යුතු රු.1,921,534ක හිඟ හිටි දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා ගෙන තිබූ අධිකරණ ක්‍රියාමාර්ගය අතර මග නැවතී තිබූ අවස්ථා 14 ක් නිරීක්ෂණය වූ අතර, පාරිතෝෂිත හා වෙනත් නඩු 07කින් අයකර ගත යුතු රු.866,910 කද අයකිරීම් ප්‍රමාද වී තිබුණි.

(iii) දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවා යෝජක ආයතනවලින් සේවක අර්ථසාධක අරමුදල වෙත අයවිය යුතු දායක මුදල් හා අධිභාර නොගෙවීම නිසා අදාල ආයතන වෙත නඩු පවරා තිබුණි. නමුත් විත්ති පාර්ශවය නොපැමිණීම නිසා හා පදිංචිය වෙනස් කිරීම වැනි හේතූන් නිසා විවෘත වරෙන්තු නිකුත් කර තිබූ රු.3,673,337ක් අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩු 20 ක් සම්බන්ධයෙන් අංක 11/2000 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03(iii) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විවෘත වරෙන්තු සම්බන්ධව ත්‍රෛමාසික වාර්තා නීති ක්‍රියා අංශයටද යවා නොතිබුණි.

(iv) දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ආයතන ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම නිසා සහ දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ බල

ප්‍රදේශයට අයත් කලාප 08 හි සේවායෝජක කම්කරු නිලධාරීන් අතර සමානුපාතිකව බෙදාදීමට කටයුතු නොකිරීම නිසා සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීම, සේවක පාරිතෝෂික අයකිරීම් සම්බන්ධයෙන් මෙන්ම කම්කරු නිලධාරීන් විසින් පරික්ෂා නොකළ ආයතන පිළිබඳ කටයුතු කිරීම හා අධීක්ෂණයද නිසි පරිදී සිදුකළ නොහැකිවීමෙන් කම්කරු කාර්යාලයකින් ඉටු විය යුතු රාජකාරි කර්තව්‍ය ඉටු කිරීමට කොළඹ කම්කරු කාර්යාලය අපොහොසත්ව තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 205 | 120 | 85 | - |
| (ii) | තෘතියික මට්ටම | 667 | 432 | 235 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,486 | 1,185 | 301 | - |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 443 | 432 | 11 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 26 | - | 26 |
| | **එකතුව** | **2,801** | **2,195** | **632** | **26** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 632 ක් පිරවීමට දෙපාරේතමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවකයන් 26 ක් පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**-----------------------------------------------------------------------**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදි වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **මුදාහැර තිබු කාල පරිච්ඡේදය** |
|---|---|---|---|---|
| (i) | කම්කරු නිලධාරි | 02 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 03 |
| (ii) | කම්කරු නිලධාරි | 02 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 02 |
| (iii) | මානව සම්පත් සංවර්ධන නිලධාරි | 01 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 14 |
| (iv) | කළමනාකරණ සහකාර | 01 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 06 |
| (v) | කළමනාකරණ සහකාර | 01 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 12 |
| (vi) | කළමනාකරණ සහකාර | 01 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වසර 09 |